කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2019

2023 ජූනි

මානවශාස්ත්‍ර පීඨය

# බෞද්ධ දර්ශනය

## බෞද්ධ චින්තාවේ සංවර්ධනය BUPH – 18224

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. බුදුරදුන් ජීවමාන අවධියෙහි ධර්ම විනය අරබයා භික්ෂූන් අතර උපන් මතවාද පිළිබඳ සමාලෝචනයක් කරන්න.

02. දෙවැනි ධර්ම සංගායනාව පැවැත්වීමට හේතු වූ ශාසනික පසුබිම අදාළ මූලාශ්‍රය ඇසුරින් ඉදිරිපත් කරන්න.

03. මහාසාංඝික නිකාය ලෝකෝත්තරවාදීන් ලෙස හැඳින්වීමේ හේතුයුක්ති ඉදිරිපත් කරන්න.

04. ආදි බෞද්ධ ඉගැන්වීම් සුරක්ෂිත කිරීම උදෙසා ථෙරවාදී භික්ෂූන් විසින් ඉටුකරන ලද මෙහෙය අගයන්න.

05. පුද්ගලවාද නිකායේ මූලික ඉගැන්වීම කෙතෙක්දුරට ආදි බෞද්ධ චින්තනයට අනුකූල වන්නේදැයි පරීක්ෂා කරන්න.

06. මාධ්‍යමික නිකායෙහි ප්‍රභවය කෙරෙහි බලපෑ විවිධ හේතුසාධක පිළිබඳ ප්‍රාමාණික විග්‍රහයක් කරන්න.

07. යෝගාචර විඥානවාද නිකායෙහි දැක්වෙන විඥානයෙහි ත්‍රිවිධ පරිණාමය පිළිබඳ ලුහුඬු විවරණයක් ඉදිරිපත් කරන්න.

08. ත්‍රිකාය සංකල්පයෙහි ආගමික සහ දාර්ශනික වැදගත්කම පැහැදිලි කරන්න.

09. මහායාන පාරමිතා සංකල්පයෙන් පිළිබිඹුවන බෝධිසත්ත්ව ප්‍රතිපදාව ගෙනහැර දක්වන්න.

10. පහත දැක්වෙන මාතෘකා අතරින් දෙකකට ප්‍රමාණවත් සටහන් ලියන්න.

    I. දසභූමි
    II. කථාවත්ථුප්පකරණය
    III. තන්ත්‍රයානය
    IV. ආර්ය නාගාර්ජුන පාදයෝ

***********************************